නුවනත විද්‍යුත් සිංහල සඟරාව
වෙළුම 01, 2022, 39 - 44

සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

# භූමිපූජා

සුදු බණ්ඩා ඉරබටු තරුව මැකෙන්නට කලින් දිනපතා කුරුල්ලන්ගේ නාදයට පෙර ම අවදි වෙයි. එය ඔහුට දැන් පුරුද්දක් වී ඇත. නිදි පැදුරෙන් අවදි වූ විගස ඔහු මුහුණ කට සෝදා ගනී. ඉන් පසු රත්තිගෙන් කිරි ටික දොවා ගනියි. උදැසන හිස්බඩ  පුරවන්නට එම නැවුම් කිරි වීදුරුව සමත් වෙයි. රාත්‍රී ඉතිරි කර තිබූ හීල්බත් කට්ට සම්බෝල සමග ආහාරයට ගැනීමෙන් පාතරාසිය ද සම්පූර්ණ වෙයි. අනතුරු ව පිනි මැකෙන්නත් පළමු ව උදැල්ල කර තබා පිටත් වන්නේ කුඹුරුයාය වෙතට ය. එතැන් සිට හිරු මුදුන්  වන තෙක් ම එක දිගට කුඹුරෙහි වැඩ කටයුතුවල නිරත වන්නේ ලබු කැටයේ ජලයට පින් සිදු වන්නට ය. මේ අතරවාරයේ ඇතැම් දිනක තේ පැන් සංග්‍රහයක් ද සිදු කරනු ලබයි. අත්පුඩි තලා අසල්වාසි ගොවියන්ට ද අමතා සියලු දෙනා අතර ම සංග්‍රහය බෙදා හදා ගනිමින් භුක්ති විඳීම සුදු බණ්ඩාගේ සිරිතකි. දහවල් ඇඹුල රැගෙන හාමිනේ පැමිණෙන තුරු ම ඔහු කුඹුරේ වල් පැළ ගැලවීම, කෙම් ක්‍රම අත්හදා බැලීම, දඬු වැට සකස් කිරීම, වක්කඩ සැකසීම හෝ වගාවට සාත්තු කිරීම වැනි කාර්යයන්වල නිරත වෙයි. මෙවැනි වැඩකටයුතු රාශියක් සිදු කළ ද සුදු බණ්ඩාට වෙහෙසක් නොදැනෙයි. සිතේ ඇති දැඩි ඇල්ම ඊට හේතු ප්‍රත්‍යය නොවූවා යැයි කිව නොහැකි ය. දරුවකු කෙරෙහි මවකගේ සිතේ පවතින දැඩි සෙනෙහසකට නොදෙවෙනි වූ දයාවක් තමා සන්තක ව ඇති එක ම වස්තුව වූ මෙම ‘දමුණුගහ කුඹුර’කෙරෙහි ද ඇති බව සුදු බණ්ඩා සිය මිතුරන් සමග පැවසුවේ වරක් දෙවරක් නොවේ.

මෙවර කුඹුරෙහි බඩ ඉරිඟු වගාවක් සිදු කිරීමේ අදහසින් ඉපනැල්ල සුද්ද පවිත්‍ර කිරීමේ කාර්යයේ නිරත වීම නිසා  සුදු බණ්ඩාට වෙනදාට වඩා වැඩියෙන් කාලය ගත විය. ගොම්මන් ඇඳිරිය වැටෙන්නට පෙර නිවසට පැමිණ කිතුල් හකුරු කැටයක් සමග රණවරා වතුර ස්වල්පයක් බී වහ වහා අමුණේ ඇළ වෙත ගමන් කළේ දිය නා ගැනීමේ අරමුණෙනි. ඇළට ඉහළින් පියඹා යන කිරි කොකුන් රැනක් දුටු සුදු බණ්ඩාට කව්සිළුම්ණේ කවියක් මතක් වූයේ නිතැතින් ය. පෙර දිනයක දහම් පාසලේ දී ඉගෙන ගත් එම කවියේ සඳහන් වූයේ, ස්වාමියා හැරදා යාම නිසා විල නමැති කාන්තාව මණිමේඛලාව ගලවා විසි කර දැමුවා සේ විලේ සිටි හංසයන් රැන සවස් කාලයේ ඉගිල ගිය බව යි.

“කිරි මුට්ටිය ඇළේ ගියා. ඇළට උඩින් කොක්කු ගියා”

යැයි කියමින් ගල්තලා මත වාඩි වී සිටි කොලු රැළ මහ හඬින් කෑ ගසමින් අත්පුඩි තලමින් ඝෝෂා කරන්නට විය. ඉන් බිය වූ කොක්කු රැන වේගය වැඩි කර වහා ඉගිළ යන්නට වූහ. ඔවුන් එසේ ඉගිළ ගොස් නතර වන්නේ ගල් ඔය ඉස්මත්තේ ය. උන් රාත්‍රී භාගය ගල් ඔය ඉවුරේ ඇති විශාල කුඹුක් ගසෙහි ගත කරන ආකාරය  සුදු බණ්ඩා දැක ඇත. ඔවුන් කුඹුක් ගසේ වැසූ පසු ගසෙහි කොළ වෙනුවට ඈතට පෙනෙන්නේ ‘සුදු පුල්ලි’ ය. කොට්ට පුළුන් ගසක කොට්ට ගෙඩි පුපුරා පුළුන් විහිදෙන්නා සේ එය අතිශයින් සුන්දර දසුනකි.

සුදු බණ්ඩාට ඇළට බැස කර වටක් දියේ ගිළුණු පසු දැනුණු සිසිලසින් ගතෙහි වූ සියලු විඩාවන් දුරු වී ගියේය. දිය නා රෑ බෝ වී නිවසට ගොඩ වූ සුදු බණ්ඩා රාත්‍රී ආහාරය ද වහා ගිල දමා වැල් ඇඳ මත හාන්සි වුණි. ගැමියන්ගේ ජීවිතය ඉතා සරල ය. දුක්බර ය. සමගි සාමයෙන් අන් අයට පීඩාවක් නොවන පරිදි ඔවුන් ගත කරන දිවි පෙවත චාම් ය. ව්‍යාජත්වයෙන් තොර ය. ඉස්තෝප්පුවේ තබා ඇති වැල් ඇඳ තරම් සුවදායක දෙයක් සුදු බණ්ඩාට තවත් නොමැති තරම් ය. එහි දිගා වූ පසු රාත්‍රී අහස මැනවින් දර්ශනය වේ. නිවී දැල්වෙන නෙක තරු රටා මිනිසුන්ගේ සංසාර චක්‍රය වැනි ය. මිය යමින් යළි ඉපිදෙමින් ගත කරන මේ සංසාරය කෙළවරක් ද නොමැත. ගැඹුරු කල්පනා ලෝකයක කිමිදෙමින් සිටින සුදු බණ්ඩා නිදි දෙව්දුවට තුරුලු  වූයේ ඔහුටත් නොදැනීම ය.

9 772950 655005

හිරු පහන් වන්නටත් පෙර අවදි වී සුපුරුදු දින චර්යාව ආරම්භ කළ ඔහුට නිතැතින් ම සිහි වූයේ පෙර දිනයේ රාත්‍රියේ දුටු සිහිනය යි. සුදු බණ්ඩා කුඹුරෙහි වැඩ කටයුතු සියල්ලක් ම සිදු කළේ සිතෙහි කොනක රඳවා ගත් සිහිනයේ සේයා කිහිපයක් ද සිහි කරමින් සිතට නඟා ගත් කුතුහලයකිනි.

ගැඹුරු නින්දක ගිලී සිටින විට තම දෙපයේ කූඩැල්ලන් සහ පණුවන්ගෙන් පිරී ඇති බව දැක බියපත් වී දොළ පාර වෙත දිව යන්නට විය. කෙතරම් උත්සාහ කර දිව යාමට සැරසුණ ද දිව යාම එතරම් පහසු නො වී ය. එපමණක් නො ව අසීරුවෙන් දිව ගොස් බැලූ විට දොළ පාරේ වතුර උඩු ගං බලා ගලන්නට විය. මඳක් නැවතී බලා සිටි සුදු බණ්ඩාට දැක ගත හැකි වූයේ ක්‍රමයෙන් පැහැදිලි ව නිසසල ව තිබූ ජලය බොර පැහැ ගැන්වී විශාල ජල කඳක් බවට පත් වන ආකාරය යි. ඉන්පසු ප්‍රචණ්ඩ වූ දිය කඳ තමා ද ග්‍රහණය කර ගන්නට සූදානම් බව යි. හදිසියේ ම විශාල වූ බොර පැහැ දිය කඳට බයෙන් පැන යාමට උත්සාහ ගත්ත ද දෙපා පොළොවට තබා තද කොට බැඳ දමා ඇත්තා සේ පා අධික බරකින් යුතු විය. මින් කෙතරම් බියට පත් වූවා ද යත් දැස් ඇර බලන විට තමා දහඩියෙන් නැහැ වී තිබෙනු දැක ගත හැකි විය. අධික පිපාසයක් දැනුණ ද ඒ සඳහා නැගිට යාමට ගතට සවියක් නො වී ය. මඳ වේලාවක් හුන් තැන ම සිටිමින් අසීරුවෙන් සිහි එළවා ගත් සුදු බණ්ඩා වෙනදාටත් පෙර අවදි වී කුඹුරට පැමිණියේ ය. මෙසේ කල්පනා ලොවක කිමිදෙමින් සිටින විට හදිසියේ ම උදැල්ලෙහි වැදුණු සනකම් සහිත යම් දෙයක් විය. ඒ කුමක් දැයි බැලීමට පහත් වනවාත් සමග ම මොනරෙකුගේ කෙකා රාවය ඇසෙන්නට විය. සිසිල් සුළඟක් දසතින් හමා යත් ම ගතට යම් සුව පහසුවක් ද දැනෙන්නට විය. උදැල්ල වැදී ඇත්තේ කුඩා ගල් කැබලි කිහිපයක් සහිත පස් පිඩැල්ලකට ය. එම ගල් කැබලි අසල වූ කඳු ඇලියෙන් සෝදා බලන්නට සුදු බණ්ඩාට සිත් විය. ඒවා යම් ආලෝකයක් සහිත ව දිස්නයක් නඟන බවත් ඔහුගේ ඇසට හසු විය.

“දහවල් ඉර එළියේ සැරට මගේ ඔළුව පුපුරු ගහනවා. නැත්නම් අව් රස්නේ වැඩි කමට ඇස් දිලිසෙනවා. මේ ගල් කොහොම ද නැත්නම් මේ විදිහට දිස්නෙ දෙන්නෙ.”

මෙසේ සිතමින් ඔහු එම ගල් කිහිපය අත්ලට එකතු කර ගන්නට විය. ඔහුට රාත්‍රියේ දුටු සිහිනය යළි යළිත් සිහිපත් විය. “ඒක නම් සුබ සිහිනයක්. මුලින් ම කිරි ගහකට යි කියන්නට ඕනෑ” හාමිනේ පැවසූ වදන් ද ඒ සමග ම සුදු බණ්ඩාට සිහි නොවුණා ද නොවේ.

ධන ලාභයක්.... සුදු බණ්ඩාගෙ මුවට සිනහවක් නැඟුණි. අතට ගත් එම ගල් කැබලි අසල දිය පහරින් ගත් වතුර ස්වල්පයකින් සෝදා හරින්නට විය.

‘කට්ට කොට්ටර’ එසේ නැතහොත් මැණික් මැරිච්ච ගල්වලින් තද වෙලා සකස් වී ඇති මෙම පස හඳුනා ගැනීමට සුදු බණ්ඩාට වැඩි වේලාවක් ගත නො වී ය. තවදුරටත් උදැල්ලෙන් පස හාරා බැලීමේ දී ‘දලන් කැබලි’ කිහිපයක් හමු වීමත් සමග සුදු බණ්ඩාගේ සැකය සහසුද්දෙන් ම තහවුරු විය.

සුදු බණ්ඩාට ඉල්ලමක් මතු වී ඇති බව ගම පුරා ම පැතිරී යාමට ගත වූයේ වියළි එඬරු බීජයක් දැල්වීමට ගත වන වේලාවටත් වඩා අඩු කාලවේලාවකි. එහෙත් සුදු බණ්ඩා පසු වූයේ දැඩි සංවේගයකිනි.

“මැණික් ඉල්ලමක් මතු වුණා ම වෙන මිනිස්සු නම් කොයිතරම් සතුටු වෙනව ද? ඔහේ මොකද මේ මූණ හපුටු කරගෙන ඉන්නේ?”

“සතුටක් නෙවෙයි හාමිනේ මගේ හිතට ලොකු බයක් දැනෙනවා.” යැයි සුදු බණ්ඩා සිය නිවස ඉදිරියෙහි තිබූ කදින් වෙන් වී කඩා වැටී ඇති කොස් අත්ත දෙස බලා මිමුණුවේ ය. පෙර දිනයේ හැමූ සුළඟ එතරම් ප්‍රචණ්ඩ නොවුණ ද නිවස ඉදිරිපිට වූ කිරි කොස් ගහේ මුදුන් අත්ත බිඳී ඇත.

9 772950 655005

"ඔහේ දැන් ම කුඹුරට යන්නේ නැහැ නොවැ. හිටින්ඩ. මං බෙලි මල් කට්ටක් සූදානම් කරන්නම්. හැලප කෑල්ලක් එක්ක." සුදු බණ්ඩාට එය නෑසුණු ගාණ යි. ඔහු මේ දිනවල කටයුතු කරන්නේ හිතේ පිරියකින් නොවේ. සිතෙහි වූ දැඩි කාන්සිය ගත ද අප්‍රාණවත් කර ඇත්තා සේ ය.

සුදු බණ්ඩා උදැල්ලත් කර තබාගෙන සුපුරුදු පරිදි කුඹුර වෙත ගමන් කරන්නට විය. කැරලෙක් මහ හඬ නංවා ඉගිළ ගියේ සුදු බණ්ඩාගේ සිතේ වූ පාළු මූසල බව තවත් වැඩි දියුණු කරමිනි.

යම් පිරිසක් රාත්‍රියේ පස් කපා දමා ඇති බව බණ්ඩාට ඈත දී ම දැක ගත හැකි විය. නියරවල් කපා දමා ලියද්දේ පස් ද පෙරළා දමා ඇති ආකාරය දුටු සුදු බණ්ඩාට ඇති වූයේ දැඩි ශෝකයකි.

ඈතින් මතු ව ආ සේදිරිස් ළඟට එන තුරු ම ඔහුට නොදැනුණේ දැඩි කල්පනාවක නිමග්න ව සිටි බැවිනි.

"සුදු බණ්ඩා අයියා.... මොකදැ මේ කුඹුරට කොරලා තියන විනාසේ. එකත් එකට ම ඊයේ රාත්‍රියේ මුන් ඉල්ලම හාරන්න ඇති. කාලකණ්ණි."

"ආ..මේ සේදිරිස් මලයා නෙවැ. ළඟට එනකං මට නිච්චි නෑ. මේ විනාස කරලා තියෙන්නේ මගේ කුඹුර නොවේ මලයා. මගේ ජීවිතේ. දන්න දා ඉඳලා අපට කන්න දුන්නේ මේ වෙල. මට මගේ අම්මා වගේ."

ඒ වචන පිට වූයේ සුදු බණ්ඩාගේ දෑස කඳුළින් බොඳ කරමිනි. වැඩි වේලාවක් ඔවුන්ට එසේ සිටින්නට අවස්ථාව ලැබුණේ නැත.

"බණ්ඩා අයියේ, අර මේ පැත්තට තකහනියේ දුවගෙන එන්නේ මුදලාලි මහත්තයා නේ ද? හැබැයි හොඳකට නම් වෙන්න බෑ."

ගමේ මෙන් ම නගරයේ ද සිය මැර ආධිපත්‍යයෙන් ජනප්‍රිය 'මුදලාලි' නමැත්තා මැණික් පතල් හෑරීම නිසා ධනවත් වූ පරිසරයට, මිනිසුන්ට සංවේදී නැත්තෙකි. ඔහු හෑරූ පතල් නිසා කිහිපවරක් ම ඔහුගේ ගෝලබාලයන් පොලීසියෙන් අත්අඩංගුවට ගත්ත ද මුදල් බලයෙන් ඔවුන් නිදහස් කර ගැනීමට මුදලාලි සමතෙකි. ධනය බලය සහිත නූගත් පුද්ගලයෙක් වුව ද ඔහුගේ මැරකම් ගමේත් නගරයේත් එක ලෙස ප්‍රචලිත ය. මිනිසුන් ඔහුට දක්වන්නේ ගෞරවයක් නො ව බියකි.

"ආ.... සුදු බණ්ඩා අයියා.... මැණික් ඉල්ලමක් මතු වුණා කියලා ආරංචියක් ආවා. අපි මේක හාරමු. මං වැඩේ බාර ගන්නම්. මං මගේ ඩෝසරයක් එවන්නම්. අයියට හොඳ ගාණක් එහෙමත් දෙන්නම්කෝ.... මේ කුඹුර මට දෙනවා හොඳයි.

ඒ වචන සුදු බණ්ඩාට ඇසුණේ වෙනත් ලොවක සිට ඇසෙන හඬක් ලෙසිනි.

"මුදලාලි, මේක අපි පරම්පරා හතක් වවාගෙන කාපු ඉඩම."

"ගොවිතැන් කරලා කාට ද හරි ගියේ බං.... මං හොඳ ගාණක් දෙන්නම් මේක ගොඩ කරමු."

"මං ඒකට කැමැති නෑ මුදලාලි. මේ කුඹුර ගොඩ කරන්න වෙන්නේ මගේ හුස්ම උඩින් තමයි එහෙනම්."

"එහෙනන් ඒකත් එහෙම ද? හොඳයි අපි බලාගමුකෝ" ඉහ වහා ගිය කේන්තියෙන් මුදලාලි සහ ඔහුගේ සහචරයන් ඉක්ම ගිය පසු ද සුදු බණ්ඩා ඒ දෙසවත් නොබලා අසල වූ ගල් තලාව මත වැතිර නිල්වන් අහස දෙස බලා සිටින්නට විය. එකඳු වලාකුළක් හෝ නොමැති අහස නිල්වන් පලසක් සේ

දිස් වේ. කුඹුරෙහි ඉපනැල්ල සුද්ද කිරීමට ගතට කිසිදු සවියක් නැත. ගතට වඩා දුබල ව ඇත්තේ සිත යි. 'නැත' මෙසේ කුඹුර විනාශ වීමට ඉඩ දිය නොහැකි ය. මැණික් උල්පත්වලට වඩා දහඩිය මහන්සියෙන් වගා කර ගන්නා අස්වැන්න උතුම් යැයි සිතා සුදු බණ්ඩා සිතට වෙර වීරිය ගෙන නැගී සිටින්නට විය. සිතට ආ නව ජවය ගත පුරා ගතේ සෑම ලේ බිඳුවක් පුරා ම පැතිර යන්නට විය.

වහා ගල් තලාවෙන් නැගී සිටි සුදු බණ්ඩා උදැල්ල ගෙන තිර අදිටනින් යුතු ව පළමු උදලු පහර පොළොවට ගැසුවේ ය. දහවල් ගෙවී රාත්‍රිය එළැඹෙන තුරු දිගට ම වෙහෙස නොබලා ම කටයුතු කළ සුදු බණ්ඩා උදැල්ල බිම තැබුවේ ආහාර ගැනීමට පමණි. ඉපනැලි සියල්ල උදලු පහරට කැපී ගොස් නිරුවත් වී පෙනෙන සරු පස දෙස සුදු බණ්ඩා බලා සිටියේ ආශාවෙනි. බඩ ඉරිඟු බීජ සිටුවා ළදරු පැළැටි සිනාසෙන කිරි දරුවන් මෙන් දැත් විහිදා නැගී සිටින විට හිරු එළිය එම දරුවන් වඩා ගන්නා පියකු සේ රැස් නමැති දැත් දිගු කරයි.

ක්‍රමයෙන් වැඩෙන බඩ ඉරිඟු ගස් රන් කෙඳි විහිදුවා රන් කරල් ලොවට දායාද කරන විට එයින් ගොවියාට ලැබෙන ප්‍රීතිය නිම්හිම් නොමැත. වගා බිම් ගොඩ කර පොළොවට රිදවා අනවසර පතල් කැණීම් කරනා විට පොළොව වේදනාවෙන් හඬා වැලපෙන දෝංකාරය පොළොවට ආදරය කරන මිනිසුන්ට අසා සිටිය නොහැකි ය.

පුර පොහොය දිනයේ පාන්දරින් ම හීල් දානය රැගෙන හාමිනේ සමග පන්සල වෙත ගිය සුදු බණ්ඩාගේ සිතට දැනුණේ මිහිරි බවකි. බෝ මළුවේ සිලි සිලි නාදයට ඔහු කවදත් ප්‍රිය කරයි. කුඩා කාලයේ සිට ම නිරතුරු ව ආ ගිය පන්සලේ ඇති නිස්කලංක ස්වභාවයට සුදු බණ්ඩා දැක්වූයේ දැඩි කැමැත්තකි. ඔහුගේ දැහැනට සමවැදි බව පහ කර දමමින් ඇසුණු ඝෝෂාවට සුදු බණ්ඩා කන් යොමු කළේ බිරිඳගේ ද මුහුණ දෙස බලමිනි.

"අපේ මහත්තයා ඩිංගි රාලගේ කටහඬ නේ ද? කාටහරි කරදරයක්වත් ද?"

"ආ.... මේ ඉන්නේ සුදු බණ්ඩා අයියා. හප්පොච්චියේ ඔහොම භාවනා කර කර ඉඳලා හරියන්නේ නැහැනේ. අන්න බණ්ඩා අයියාගේ කුඹුර ගොඩ කරනවා මන්ත්‍රීතුමා."

"මොනවා. අයියනායක දෙයිහාමුදුරුවනේ. ඒ මොන අපරාධයක් ද?" හාමිනේ එය පවසා නිමවන්නටත් පෙර සුදු බණ්ඩා පන්සලේ කඩුල්ල ද පැන ගොස් අවසන් ය.

ඈත දී ම සුදු බණ්ඩාට ඇති වූයේ සැකයකි. කුඹුර අසල නවතා තිබූ බැකෝ යන්ත්‍රය හා මන්ත්‍රීවරයාගේ සහචරයන් කිහිප දෙනෙක් පිරිවරා ගත් මිනිසුන්ගේ ඒ සැකය වැඩි දියුණු කිරීමට සමත් විය. සුදු බණ්ඩා වහ වහා පිරිස සිටි ස්ථානය වෙත පය කඩිනම් කර තබමින් දිව ගියේ ය.

"මහත්තයා.... කාගේ අවසරයකින් ද මගේ කුඹුර ගොඩ කරන්නේ?"

හෙතෙම සිතට එන කෝපය මැඩ ගනිමින් දැත් බැඳ, කුඹුරෙහි වූ පස් පෙරළා දමන බැකෝ යන්ත්‍රය දෙස බලා සිටින පුද්ගලයාගෙන් ඇසූයේ මේ සිදු වන කිසිවක් අවබෝධ කර ගත නොහැකි ව ය.

" ඇයි ලොකු උන්නැහේ තමුන්ගේ ඇස් පේන්නේ නැද්ද? අපි මේ කුඹුර ගොඩ කරනවා."

"මහත්තයෝ මේක මගේ කුඹුර නොවැ. අපේ අම්මා අප්පා විතරක් නෙවෙයි හත්මුතු පරම්පරාව ම වවාගෙන කෑවේ මේ කුඹුර. දැන් ඒ රත්තරං කුඹුර ගොඩ කරල දැම්ම ම කොහොම ද අපි ජීවත් වෙන්නෙ?"

සුදුබණ්ඩා එම අඳෝනාව සිදු කළේ හදවතට නැඟි දැඩි වේදනාව තරයේ මැඩ ගනිමිනි. කෙතරම් සැඟවීමට උත්සාහ කළ ද හදවත පෙළන එම වේදනාව යළි යළිත් මතු ව එන්නේ හොඳින් වියළි පිදුරු ගොඩකට ඇවිළුණු ගින්නක් පරිද්දෙනි.

9 772950 655005

"ඒවා අපි දන්නේ නැහැ. මන්ත්‍රීතුමාගෙන් අපිට ඕඩරේ ආවා. මේ කුඹුරේ මැණික් ඉල්ලමක් මතු වෙලා කියලා. ඉතින් දැන් මේ කුඹුර ම වුණත් අපි හාරනවා."

"ඒක සහගහන අපරාධයක්නෙ මහත්තයෝ. අපිට තියෙන එක ම වස්තුව මේක."

"ඒක නං අපි දන්නේ නැහැ ලොකු උන්නැහෙ. මැණික් තියෙනවා නම් ඒ ඉඩමේ අයිතිය තියෙන්නේ අපේ මන්ත්‍රීතුමාට. අනික මේ කුඹුර තියෙන්නෙත් අපේ මන්ත්‍රීතුමාගේ ඡන්ද කොට්ඨාසයේ."

සුදු බණ්ඩාට ඇති වූ කේන්තියෙහි නිම්හිම් නැති විය. එහෙත් එතැන සිටි පිරිස තමා පයට පැගෙන දූවිල්ලක් තරම්වත් මායිම් නොකරන බව සුදු බණ්ඩාට සක්සුදක් සේ ප්‍රත්‍යක්ෂ විය.

වාර්ෂික ව ගම්මුන් පවත්වන 'අලුත් සහල් මංගල්‍යය' සඳහා වෙන් කර තැබූ අගස්මිටියක් අසල වූ කොස් ගසෙහි අත්තක විය. සුළඟෙහි වේගය දරා ගත නොහැකි ව අගස්මිටියේ කරල් ඒ මේ අත වැනෙයි. වෙල් යායේ ම අස්වැන්නෙහි අග්‍ර භාගය බුදුන් ප්‍රමුඛ මහ සංඝරත්නයටත්, සියලු ම දෙවි දේවතාවුන්ටත් පුද දෙන්නේ තමාගේ දමුණුගහ කුඹුරෙහි සකස් කරන ලද විශේෂ මණ්ඩපයේ දී ය. ගමේ ම පිරිමින්ගේ සහභාගිත්වයෙන් පවත්වන එම අලුත් සහල් මංගල්‍යය ගමට ම මංගල සිරිය ගෙනෙයි. බෙර හඬ සහ සංඛ නාදය සුදු බණ්ඩාට අසෙන්නාක් වැනි ය. ඔහු ආශාවෙන් කන් යොමා සුළඟේ මුසු ව ආ එම හඬ අසා සිටින්නට විය. හදිසියේ ඇද හැළුණ පොද වැස්ස සුදු බණ්ඩාට දැනුණේ නැත.

"සුදු බණ්ඩා අයියේ, ග්‍රාම සේවක මහත්තයා හම්බ වෙන්න යන එක තමයි මේ වෙලාවේ කරන්න තියෙන හොඳ ම දේ." එය සියාතුගේ අදහස යි. ගමේ බොහෝ දෙනෙක් ද එය අනුමත කරමින් කතා බස් කරනු ඇසෙයි. අසල්වාසීන් සුදු බණ්ඩාගේ සිත අස්වැසීමට කරුණු කියන්නට විය. එහෙත් ඒ කිසිවකින් සුදු බණ්ඩාගේ සිත සන්සුන් වූයේ නැත.

"වැඩක් නැහැ මලයා. කවුරු හම්බ වෙන්න ගියත් ඔය ටික තමයි." සුදු බණ්ඩා මුවින් එසේ පැවසූ නමුත් තමා සතු වූ එක ම මඩ ඉඩම ද ධන නිධානය ද වූ 'කුඹුර'බේරා ගැනීමට නම් ග්‍රාම නිලධාරී හමු වී හෝ පිංසෙණ්ඩු විය යුතු බව අවසානයේ දී කල්පනා කර බලන්නට විය.

"හාමිනේ මං ග්‍රාමසේවක මුණගැහිලා එන්නම්" අවසානයේ දී සිත එකඟ කර ගනිමින් දැඩි තීරණයක් ගත් හෙතෙම කර ලේන්සුව ද ගනිමින් පාර දෙසට යන්නට පෙර තම බිරිඳට උස් හඬින් පැවසුවේ ය. සුදු බණ්ඩාගේ කටහඬින් කල්පනාව බිඳ ගත් 'මැණිකා' පැවසිය යුත්තේ කුමක් දැයි නොදැන සුදු බණ්ඩා දෙස මුව අයා ගෙන සිටින්නට විය. බැස යන හිරුගේ මලානිකත්වය වසා ගත් ශෝකයෙන් පීඩිත මුවින් සුදු බණ්ඩා ග්‍රාම නිලධාරී සිටින නිවස වෙතට ම ගියේ මොහොතක් හෝ ඉස්පාසුවක් නොලබමිනි.

තමා සිතූ ලෙසට ම ඉන් අත් වූ ඵලයක් නො වී ය. "කළුගලේ ඔළුව ගසා ගත නොහැකි බවත් කුඹුර මන්ත්‍රීවරයාට ම විකුණා දමා තමාට ද සුපුරුදු ගොවිතැන අතහැර 'මැණික් පතල් හැරීමේ ව්‍යාපාරයට" සම්බන්ධ වී 'මුදලාලි' සමග සුහද ව කටයුතු කරන ලෙස තම ගැටලුවට ග්‍රාම නිලධාරීවරයාගෙන් ලැබුණු විසඳුම මෙන් ම අවවාදය විය. තමාට ද මන්ත්‍රීවරයාගේ බලයට හා තීරණයට විරුද්ධ ව කිසිවක් කිරීමට නොහැකි බවත්, එයට තමා පෞද්ගලික ව ද අකැමැති බවත් ග්‍රාම නිලධාරීවරයාගේ ප්‍රකාශයෙන් ව්‍යංග්‍යාර්ථයෙන් පළ වූ අදහස යි. සුදු බණ්ඩාට එය වටහා ගැනීමට අසීරු නො වී ය. තමා සතු වූ අවසන් තුරුම්පුව ද ගසා දැමූ නමුත් ඉන් පලක් නොවූවකු සේ බණ්ඩා නිවසට පැමිණියේ රැහැයියන්ගේ නාදය ද රැගෙන ය. තොරතෝංචියක් නොමැති ව නැඟෙන රැහැයියන්ගේ නාදය සුදු බණ්ඩාගේ සිතේ නැඟෙන විලාපය බඳු ය.

මුළු රැය ම සුදු බණ්ඩාට නින්දක් නො වී ය. සවස් යාමයේ කඩමණ්ඩියේ දී ගමෙහි වූ ක්‍රියාකාරී තරුණ ගැටවරයින් පිරිසක් වූ 'සේනක' සහ ඔහුගේ මිතුරන් විසින් පවසන ලද්දේ, රාත්‍රියේ භූමි තෙල් දමා බැකෝ යන්ත්‍රයත්, පොල් අතු වාඩියත් රහසේ ම ගිනි තැබිය යුතු බව යි. එහෙත් තලත්තැනි වයසේ පසු වූ අත්දැකීම් බහුල මිනිසෙකු වූ 'සුදු බණ්ඩාට' එවැන්නක් සිදු කිරීමට කිසිසේත් ම සිත ඉඩ නොදෙයි.

අරුණටත් පෙර නැගී සිටි සුදු බණ්ඩා උදැල්ල කරට ගත්තේ උණ රෝගියෙකු සේ ය. 'මෙම උදැල්ල රැගෙන ගොස් කුමක් කරන්න ද?' තම සිත විමසන එම පැනයට පිළිතුරක් සුදු බණ්ඩා සතු ව ද නො වී ය. එනමුදු සුපුරුදු දින චර්යාව මඟ හරවා ගත නොහැකි වූ හෙතෙම තම කුඹුර වෙතට ම පියවර මැනී ය. ඈත දී ම යකුන් නැටූ සොහොන් භූමියක් වැනි කුඹුරු යාය දකිත් ම ඔහුගේ හදවත හඬා වැටෙන්නට විය. සරුවට වැඩුණු අස්වැන්න සහිත කුඹුරු යායවල් අතරින් 'දමුණුගහ කුඹුරට' ද හිමි වූයේ සුවිශේෂී ස්ථානයකි.

'දේවො වස්සතු කාලේන සස්ස සම්පත්ති හෝතු ච' යන්න පසක් කරමින් කලට වේලාවට වැසි ලැබී ගම්මුන්ගේ බඩකට පමණක් නො ව සංඝයා වහන්සේට ද දාන වේල නොවැරැද්ද වූ මෙම වෙල් යාය අවසන් හුස්ම අයැදිමින් සිටියි. බඩ ඉරිඟු සිටුවනු පිණිස සකස් කර තිබූ සරු පස පෙරළා දමා ඇත. උදැල්ල පසෙකින් තැබූ සුදු බණ්ඩා දෑත ම හිස මත තබා ගනිමින් පොළොවෙහි දණ තබා ගත්තේ ය. මහ රහතන් වහන්සේලාගේ, පසේ බුදුවරුන් වහන්සේලාගේ ධාතූන් වහන්සේලා සඟවා ගත් පෞරාණික පන්සල් දේවස්ථාන සඟවා ගත් පොළොව මහී කාන්තාවට මාගේ නමස්කාරය වේවා! හිස පහත් කොට මහ පොළොව සිප ගත් සුදු බණ්ඩා තම බඩවියත රැක දුන් පොළෝ තලය වරක් දෙවරක් නො ව සියදහස් වරක් සිප ගත්තේ ය.

"මැණිකේ අක්කණ්ඩි. අන්න සුදු බණ්ඩා අයියා දමුණුගහ කුඹුර ළඟ වැටිලා ඉන්නවා. හනිකට යමු."

මැණිකාට එම හඬ ඇසුණේ වෙනත් ලොවක සිටි යමෙකු කියන්නාක් සේ ය.

ඩී.එම්.ඒ. සෙව්වන්දි
සිව්වන වසර
සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාපීඨය
රුහුණ විශ්වවිද්‍යාලය
Sewwandiapsara17@gmail.com

9 772950 655005